www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව ගැඹුරු වන ආර්ථික අර්බුදයකට මුහුන දෙයි

## Sri Lankan government confronts deepening economic crisis

**කේ. රත්නායක විසිනි**
**2004 සැප්තැම්බර් 17**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ලෝක වෙළඳ පොළේ තෙල් මිල ගනන් ඉහල යාමේ, දරුනු නියගයක හා රට යලි සිවිල් යුද්ධයට ඇද වැටීම පිලිබඳ භීතියෙන් ගලා එන දේශපාලන අවිනිශ්චිත භාවයේ බරින් මැඩී ඇද්දී ගෙන යයි. එහි ප්‍රතිඵලයක් ලෙස සිදුව ඇති භාන්ඩ මිල ගනන් ඉහල යාමත් රැකියා බාදනයත් පුද්ගලීකරනය හා ප්‍රතිව්‍යුහකරනය ඉදිරියට ගෙන යන ලෙස කෙරෙන බලපෑමත් වැඩෙන සමාජ අසහනය තවත් තීව්‍ර කරමින් ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගත් ඇගේ අස්ථාවර එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුවත් මුහුන දෙන දේශපාලන අර්බුදය සංකීර්න කරයි.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ව්‍යාපාරික සඟරාවක් වන *ලංකා මන්ත්ලි ඩයිජස්ට්* සිය සැප්තැම්බර් කලාපය තුල අශුභවාදී ලෙස මෙසේ අදහස් දැක්වී ය: "වියදම් සහගත (හා නිසැකව ම දේශපාලනිකව මෙහෙයවුනු) රාජ්‍ය සහනාධාර පවා මිල ගනන් පාලනය කිරීමට ප්‍රමානවත් නො වී ය... ආන්ඩුවේ අයවැය හිඟය පුලුල් වී ඇත, රටේ වෙළඳ හිඟය පිම්බී ඇත, ... රුපියල ප්‍රපාතයකට ඇද වැටී තිබේ. ... ශ්‍රී ලංකාවේ මුලු විනිමය සංචිතය එ.ජ. ඩොලර් මිලියන 3ට යන්තම් ඉහල මට්ටමක් කරා හැකිලී ඇත. ... ජාතික ආර්ථික වර්ධනය පිලිබඳ අනාවැකි සියයට හතක තරම් ඉහල මට්ටමක සිට සියයට 5ක් යැයි විය හැකි මට්ටමක් කරා පහල දමා තිබේ (මහ බැංකුව විසින්). ... සත්තකින් ම *සමස්ත තත්වය ම අඳුරු ය.*"

ආර්ථික අටුවාකරුවෝ අනතුරුදායක සංඥා ගනනාවක් ම පෙන්වා දෙති. ජාත්‍යන්තර තෙල් මිල ගනන් අගෝස්තු මස මැද බැරලයක් ඩොලර් 50කට ආසන්න මට්ටමක් කරා ලඟා වීමෙන් පසුව දැන් යම් ආකාරයකින් මඳක් පහල බැස ඇති මුත් ඉහල මිල ගනන් ජංගම ගිනුමේ හිඟය මත අහිතකර ලෙස බලපා ඇත. වාර්ෂික තෙල් ආනයන බිල ඩොලර් මිලියන 850-900 මට්ටමේ සිට ඩොලර් මිලියන 1,200-1,300 මට්ටම දක්වා නැගෙතැයි තක්සේරු කර තිබේ -- එනම්, දල වසයෙන් සියයට 40ක නැගීමකි.

තෙල් බිල ගෙවනු පිනිස වඩ වඩා ඩොලර් පිටතට ඇදී යාම, එක්සත් ජනපද ඩොලරයේ අගය ඉහල යාම හා එක්ව, ශ්‍රී ලංකා රුපියලේ අගය තියුනු ලෙස කඩා වැටීමට හේතු වී ඇත. එක්සත් ජනපද ඩොලරයේ හුවමාරු අනුපාතිකය මෙම වසරේ ආරම්භයේ තිබූ රුපියල් 97 හා අප්‍රේල් මස තිබූ රුපියල් 98 සිට අගෝස්තු 2 දා මෙතෙක් පැවති ඉහල ම අගය වන රුපියල් 104 කරා සේන්දු විය. සියලු ආනයනික භාන්ඩවල මිල ගනන් ඉහල දමමින් පසු ගිය මාස අටක කාලය තුල රුපියල සියයට 7කින් අවප්‍රමානය වී තිබේ.

මහ බැංකු සංඛ්‍යා ලේඛනවලට අනුව, 2004 වසරේ මුල් හය මසක කාලය තුල වෙළඳ හිඟය පසු ගිය වසරේ එම කාල පරිච්ඡේදයේ අගය වන ඩොලර් මිලියන 700ට සන්සන්දනාත්මකව ඩොලර් මිලියන 1,126 දක්වා ඉහල නැග තිබේ -- එනම් සියයට 60ක නැගීමකි. භාන්ඩාගාර ලේකම් පී.බී. ජයසුන්දරට අනුව, සමස්ත ගෙවුම් ශේෂ හිඟය ඩොලර් මිලියන 300 දක්වා ඉහල නැග තිබේ. අගෝස්තු මාසය සඳහා සංඛ්‍යා ලේඛන නිසැකව ම තවත් නරක අතට හැරී ඇති අයුරු පෙන්නුම් කරනු ඇත.

පැවති එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුවට එරෙහි මහජන වෛරය ගසාකමින් අප්‍රේල් මැතිවරනයෙන් අවිනිශ්චිත ජයග්‍රහනයක් ලබා ගැනීමට එජනිසය සමත් විය. පුද්ගලීකරනය නතර කොට, රාජ්‍ය අංශයේ වැටුප් ඉහල දමා, කෘෂිකාර්මික සහනාධාර යලි තහවුරු කර සුභ සාධන ඉහල දමන බවට කුමාරතුංග සහ ඇගේ හවුල්කරුවෝ පොරොන්දු වූහ. බලයට පැමිනීමෙන් පසුව එජනිසය තමන්ගේ පොරොන්දු සියල්ල ම පාහේ කඩ කර වත්මන් ආර්ථික අර්බුදයේ බර මුලුමනින් ම වැඩ කරන ජනතාවගේ කර මත තැබී ය.

අගෝස්තු මාසයේ දී පෙට්‍රල් මිල ගනන් දෙවරක් ඉහල ගියේ ය. ආහාර පිසීමට යොදා ගන්නා ගෑස් මිල ගනන් පසු ගිය මාසයේ දී දෙවරක් ද පසු ගිය සති අන්තයේ යලි වරක් ද වැඩි විය. එය මුලුමනින් ම ගත් විට සියයට 33ක නැගීමකි. රටේ ප්‍රධාන ආහාරය සඳහා යොදා ගන්නා සහල් මිල පසු ගිය මාස හතර තුල කිලෝග්‍රෑමයක් රුපියල් 33 සිට රුපියල් 44 දක්වා සියයට 16කින් නැග ඇත. කිරිපිටි අඩු ගනනේ සියයට 6කින් ඉහල නැග තිබේ. සැප්තැම්බර් 1 දා සිට බස් ගාස්තු සියයට 12.5 සිට 16 දක්වා ප්‍රමානයන්ගෙන් වැඩි විය. ලංකා විදුලි බල මන්ඩලය විදුලි ගාස්තු සියයට 5කින් ඉහල දැමීම පිනිස ආන්ඩුවේ අනුමැතිය

ඉල්ලා ඇති අතර ජල සම්පාදන මන්ඩලය ද එයාකාර ඉහල දැමීමක් ඉල්ලා තිබේ.

සහනාධාර ක්‍රමය අවසන් කොට, එමගින්, පිම්බෙන අයවැය හිඟය කප්පාදු කරන ලෙස මහ ව්‍යාපාරිකයන්ගෙන් එල්ල වන වැඩෙන පීඩනයට ආන්ඩුව මුහුන දී සිටී. අගෝස්තුවේ දී ලංකා වෙලඳ මන්ඩලය "ඉහල යන ජාත්‍යන්තර මිල ගනන් සමග මුලුමනින් ම ගැලපෙන පරිදි පෙට්‍රල් හා ඩීසල් මිල ගනන් සහ විදුලි බල ගාස්තු වහා ම සංශෝධනය" කල යුතු ය යි ඉල්ලා සිටියේ ය. අයවැයේ පිම්බීමක් පොලී අනුපාතික තියුනු ලෙස ඉහල යාමට තුඩු දෙනු ඇතැයි යන්න පිලිබඳව සංගත නායකයෝ උත්සුක වී සිටිති.

මැයි මාසයේ සිට රටේ දිස්ත්‍රික්ක 25න් 14ක් දරුනු නියඟයකට මුහුන දී සිටී. අක්කර ලක්ෂ ගනනක ජූනි-සැප්තැම්බර් කන්නය සඳහා වී හා සෙසු බෝග වපුරා නැත. ජනගහනයෙන් සියයට 16ක් වන විපතට පත් පවුල්වලට ආහාර සහ සෙසු සහන සැපයීම පිනිස, නිල තක්සේරුවලට අනුව, රුපියල් බිලියන 2ක් අවශ්‍ය ය. එහෙත් ආන්ඩුව සපයා ඇත්තේ ඉන් අඩකටත් අඩු ප්‍රමානයකි.

ආන්ඩුව මුහුන දී සිටින්නේ බැරෑරුම් මූල්‍ය අර්බුදයකට ය. ආනයන බිල් හා නය ගෙවීමට සහ පාලන තන්ත්‍රය නඩත්තු කරනු පිනිස අවශ්‍ය අරමුදල් වේගයෙන් වියැකී යමින් පවතී. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සාම සාකච්ඡා යලි ඇරඹීමට කුමාරතුංග අසමත් වීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව හා ආධාර දෙන රටවල් දීමට නියමිත නය අත්හිටුවීමට තුඩු දී තිබේ. පසු ගිය වසරේ ජූනි මස ටෝකියෝ ආධාර සමුලුවේ දී ඩොලර් බිලියන 4.5ක නය ආධාර පොරොන්දු වූ නමුත් එම මුදල් ලබා දීම ඊනියා සාම ක්‍රියා දාමයේ හා වඩා දුර දිග යන ප්‍රතිව්‍යුහකරන වැඩ පිලිවෙලේ අඛන්ඩතාවට ගැට ගසනු ලැබී ය.

පසු ගිය වසරේ අප්‍රේල් මස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඩොලර් මිලියන 657ක නය පොරොන්දු වුනත් එයින් ලබා දී ඇත්තේ ඩොලර් මිලියන 81ක පලමු වාරිකය පමනි. කුමාරතුංග පසු ගිය නොවැම්බරයේ දී එවකට පැවති එජාපෙ ආන්ඩුව අතින් මූලික අමාත්‍යාංශ තුනක් පවරා ගෙන අනතුරුව පෙබරවාරියේ දී ආන්ඩුව ම බලයෙන් පහ කලාට පසුව ඉතිරි මුදල් ලබා දීම අත්හිටුවනු ලැබී ය. අප්‍රේල් මැතිවරනයෙන් පසුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අවධාරනය කලේ එජාපෙ "යලි පුබුදමු ශ්‍රී ලංකා" මෙන් එජනිසය ද ආර්ථික ප්‍රතිව්‍යුහකරනය පිලිබඳ "පැහැදිලි සැලසුමක්" ඉදිරිපත් කල යුතු බව යි. මහජනතාව වෙතින් ප්‍රතිප්‍රහාරයක් එල්ල වෙතැයි බියෙන් කුමාරතුංග එවැන්නක් ඉදිරිපත් කිරීමට තව මත් අපොහොසත්ව සිටී.

ඔක්තෝබර් 2-3 දිනවල නිව් යෝක් නුවර දී පැවැත්වීමට නියමිත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්ෂික රැස්වීමේ දී මුදල් ඇමති සරත් අමුනුගම අරමුදලේ නිලධාරීන් හමු වීමට ඉඩ ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මොන යම් හෝ මුදලක් ලැබීමට ඇති ඉඩ කඩ බොහෝ සෙයින් අඩු වන කොන්දේසි යටතේ ආන්ඩුව ඔපෙක් නිලධාරීන් හමු වනු පිනිස පසු ගිය සතියේ දී අමුනුගම හා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වන ජයන්ත ධනපාල වියානාවට යැවී ය. රුපියල් බිලියන 844ක් වන ශ්‍රී ලංකාවේ විදේශ නයවලින් බිලියන 538ක් ම ඔපෙක් රටවලට ගෙවිය යුතු මුදල් ය.

සාකච්ඡාවලට එක් වන ලෙස එල්ටීටීඊයට බල කිරීමෙහි ලා දේශපාලන සහයෝගය ලබා ගැනීමත් මූල්‍ය ආධාර හිඟාකෑමත් පිනිස කුමාරතුංග විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ටෝකියෝවට යැවීමට පියවර ගත්තා ය. " 'ආධාර නිදහස් කර ගැනීමේ ක්‍රම සහ විධි' සොයා ගැනීමට ටෝකියෝවට උත්සාහ කල හැකැයි තමන් බලාපොරොත්තු වන බව" කදිරගාමර් පැවසුවේ යැයි පසු ගිය සතියේ දී *අසාහි ෂිම්බුන්* පුවත්පත වාර්තා කලේ ය.

නොවැම්බර් 10 අයවැය සඳහා සැලසුම් ඇරඹී ඇති අතර එජනිසය අවශ්‍ය අරමුදල් සොයා ගැනීමෙහි ලා මංමුලා සහගතව සිටී. සිය මැතිවරන පොරොන්දුවලින් එය ක්‍රියාවට දමා ඇත්තේ එකක් පමනි: එනම් යූරියා පොහොර සහනාධාරය යලි ස්ථාපිත කිරීම යි. සියලු රැකියා විරහිත උපාධිධාරීන්ට හා උසස් පෙල සමතුන්ට රැකියා සපයන බවට එජනිසය පොරොන්දු විය. කෙසේ වෙතත් මේ වන තෙක් සිදු කොට ඇත්තේ 60,000ක් යැයි තක්සේරුගත උපාධිධාරීන්ගෙන් 17,000ක් පමනක් පුහුනුවකට බඳවා ගැනීම පමනි.

එජනිසය මාස තුනක් ඇතුලත දී රජයේ සේවකයන්ගේ වැටුප් සියයට 70කින් වැඩි කරන බවට දුන් තම පොරොන්දුව ද මග හරිමින් සිටී. *සන්ඩේ ලීඩර්* පුවත්පත සමග මෑතක පැවති සම්මුඛ සාකච්ඡාවක දී භාන්ඩාගාර ලේකම් පී.බී. ජයසුන්දර මෙසේ ප්‍රකාශ කලේ ය: "මා දන්නා පරිදි ආන්ඩුව සියයට 70ක වැටුප් වැඩි වීමක් ගැන කතා නො කලේ ය. . . . විවිධ මිනිස්සු දේශපාලන වේදිකා මත විවිධ සංඛ්‍යා ගැන කතා කරති." සහනාධාර තව දුරටත් කප්පාදු කරන බව අඟවමින් ඔහු මෙසේ පැවසී ය: "දැනට විශාල ලෙස සහනාධාර ලබා දෙන ප්‍රධාන භාන්ඩ වන්නේ ඩීසල් හා භූමිතෙල් ය. අප මේ ගැටලුවලට ප්‍රතිචාර නො දැක්වුව හොත් එය ආර්ථිකය මත නිසැකව ම ආතතියක් නිර්මානය කරනු ඇත."

අගෝස්තු 29 දා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ දී කතාවක් පවත්වමින් අමුනුගම පටි තද කර ගැනීමේ පිලිවෙත් ගැන අනතුරු ඇඟවී ය. "අප මුහුන දී සිටින්නේ අසීරු කාල පරිච්ඡේදයකට ය. අපි තෙල් කම්පනයකට හා දරුනු නියඟයකට මුහුන දී සිටිමු. මා එය විස්තර කරන්නේ ද්විත්ව ග්‍රහ දෝෂයක් ලෙස ය." ඔහු සියල්ල නිසි මගට ගෙන ඒමේ වැඩ පිලිවෙලක් පොරොන්දු වූයේ මෙසේ පවසමිනි: "එය දැඩි හා ජනප්‍රිය නො වන තීන්දු ඉල්ලා සිටිනු ඇත.

ඒවා බොහෝ කලක් තිස්සේ කල් දමනු ලැබ ඇති නිසා එවන් තීන්දු ගැනීමට අපි අධිෂ්ඨානවත්ව සිටිමු."

අයවැයෙන් දැඩි පටි තද කර ගැනීමේ පිලිවෙත් ඉදිරිපත් වීමට ඇති ඉඩකඩ යටතේ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) උභතෝකෝටිකයකට මුහුන දී සිටී. එජනිසයේ හවුල්කරුවකු ලෙස ප්‍රථම වතාවට බලයට පත්ව සිටින මෙම පක්ෂයේ හිස් ජනතාවාදී වාචාල කතාවල නො වටනා භාවය වේගයෙන් එලිදරව් වෙමින් පවතී. විටින් විට තමන් "සමාජවාදී" හා "මාක්ස්වාදී" යැයි කියා පාන ජවිපෙ නො දන්නා විපාර්ශ්වික ආධාරකරුවන් මත වරද පැටවීමේ තකතිරු උත්සාහයක යෙදී ඇත. ජවිපෙට අනුව, රුපියලේ අගයට වල කපා ඇත්තේ භූගෝලීය ධනවාදයේ ක්‍රියා දාමය නො ව "මහ බැංකුවේ හා ආන්ඩුවේ සිටින එජාපෙ ගැති නිලධාරීන්ගේ කුමන්ත්‍රනයක්" මගිනි.

එමෙන් ම තමන්ගේ ම බංකොලොත් පිලිවෙත්වලින් අවධානය වෙනතකට යොමු කිරීමේ තවත් විධික්‍රමයක් ලෙස සිංහල ස්වෝත්තමවාදය ඇවිලවීමෙහි ද ජවිපෙ යෙදී සිටී. අගෝස්තු මස අග දී ජවිපෙට සම්බන්ධ බෞද්ධ භික්ෂු සංවිධානයක රැස්වීමක් අමතමින් මහාචාර්ය අත්තනගේ රතනසාර හිමියන් අවධාරනය කලේ, ආන්ඩුව බලයේ සිටින්නේ ජීවන මට්ටම් ආරක්ෂා කිරීමට නො ව "මව් බිම රැක ගැනීමට" බව යි. "එජනිස ආන්ඩුව බලයට ගෙන ආවේ රැකියා දීමට හා බඩු මිල අඩු කිරීමට නො ව ... රට බෙදීම නතර කිරීමට යි."

ජවිපෙ ප්‍රතිචාරය පෙන්නුම් කරන්නේ ආර්ථික අර්බුදයේ මුලු බර ම වැඩ කරන ජනතාව මත පැටවීම හැර වෙනත් විකල්පයක් එජනිස ආන්ඩුවට නැති බව යි. එයට එරෙහි ඕනෑ ම විරුද්ධත්වයක් සම්බන්ධයෙන් ඔවුන් ක්‍රියා කරනු ඇත්තේ වැඩ කරන ජනතාවට "එජාපෙ ආධාරකරුවන්" ලෙස අවලාද නැගීම හා භේදකාරී වර්ගවාදී වෛරය ඇවිලවීම මගිනි. ඒ සියල්ල අසාර්ථක වුව හොත් විරෝධතා හා පෙලපාලි මඩිනු පිනිස මෘග බලය යොදා ගැනීමට ජවිපෙ හා ආන්ඩුව නො පැකිලෙනු ඇත.

© www.wsws.org